# සපරගමු දිග්ගෙයි නැටුම් සම්ප්‍රදාය පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

එච්.පී.එස්. අනුරුද්ධිකා

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය.
Shyamali98anuruddhika@gmail.com

**මුඛ්‍ය පද -** වලව්, දේවාල, දිග්ගෙය, නින්දගම්, කාන්තාව

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වැඩිම නින්දගම් ප්‍රමාණයකට හිමිකම් කියන ප්‍රදේශය සබරගමුව වන අතර නින්දගමක් යනු පුරාණ ලාංකේය රදලයන් සතු වූ ඉඩකඩම් වේ. ඒ තුළ නිර්මාණය කරගත් වලව් පාදක කර ගනිමින් ඊටම ආවේණික නර්තනාංගයක් ලෙස හඳුනාගත හැකි දේවදාසී සංකල්පයට සමානකම් කියන දිග්ගෙයි නර්තනය යනු වර්තමානය වනවිට අභාවයට ගොස් ඇති සංකල්පයක් ලෙස හඳුනාගත හැකිය. දේවදාසියගේ ලිංගික ජීවිතයෙන් මිහිකත එල ගැන්වීම සහ සරු බව සංකේතවත් කරන බවත් ඇයගේ නර්තන විලාසයෙන් ස්වභාව ධර්මය ප්‍රීතියට පත් කරන බවත් මූලාශ්‍ර තුළින් හඳුනාගත හැකි වූ අතර ලංකාවේ දේවාල ආශ්‍රිතව රඟ දැක් වූ දිග්ගෙයි නර්තනය ද සශ්‍රිකත්වය අරමුණු කර ගනිමින් පවත්වන්නට ඇති බව ද හඳුනාගත හැකිවිය. අතීතයේ සිංහල නර්තනය පුරුෂයන්ට පමණක් ආවේණික වූ අතර රජ දරුවන් පිනවීම ස්ත්‍රීන් පමණක් සිදු කරන ලද්දේ ඊටම වෙන් වූ ස්ථානයක සිට ය. හින්දු ආභාසය කැටිකර ගනිමින් වලව්, රජ මාළිගා මුල් කරගෙන පවත්වන ලද දිග්ගෙයි නර්තනය නිලධාරී පිනවීම අරමුණු කරගත්ත ද දෙවියන්ට භක්ති ප්‍රණාම දැක්වීම මුල් කරගෙන ගායන, වාදන, නර්තනාංගවලින් යුක්තව දේවාල මුල් කරගනිමින් පසුකාලීනව එහි බෞද්ධාගමික මුහුණුවරකින් දිග්ගෙයි නර්තනය ක්‍රියාත්මක වූ බව අධ්‍යයනයෙන් හඳුනාගත හැකි විය. ඒ අනුව වර්තමාන සමාජයෙන් ගිලිහී යන සපරගමුවේ දිග්ගෙයි නර්තනයේ ස්වරූපය කෙබඳු ද යන්න මානවවංශ විද්‍යාත්මකව අධ්‍යයනය කිරීම අධ්‍යයන ගැටළුව බවට පත් වූ අතර අභාවයට යන්නා වූ අස්පර්ශනීය උරුම හරහා ලාංකේය ඉතිහාසය නැවත ප්‍රතිනිර්මාණය කරලීමත්, එතුළින් හෙළිවන ඉතිහාසය අධ්‍යයනය කරලීමත් මෙම අධ්‍යයනයේ මූලික පරමාර්ථය බවට පත්විය. අත් සහ සිරස චලනය කරමින් චමත්කාර ජනක සිතුවම් මැවීම මෙහිදී සිදු වූ අතර දේවදාසී සංකල්පයේ බලපෑමෙන් සංස්කෘතිකමය වශයෙන් ලංකා සමාජය යම් බලපෑමකට ලක්ව ඇති අයුරු හඳුනාගැනීමත් මෙහිදී සිදුවිය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී ක්ෂේත්‍ර සහ ක්ෂේත්‍ර නොවන අධ්‍යයන ක්‍රමවේදය යටතේ දත්ත හඳුනාගන්නා ලදී. එහිදී පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය ඔස්සේ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර අධ්‍යනය කරමින් ගුණාත්මක දත්ත විවරණය කිරීම සිදුවිය.

## ප්‍රතිඵල සහ සාකච්ඡාව

ශ්‍රී ලංකාවට ආවේණික එකම නර්තන ක්‍රමය ලෙස හඳුන්වන දිග්ගෙයි නර්තනය ස්ත්‍රීන් විසින් රඟ දැක්වුවද සමහර අකැප කාලවල දී පුරුෂයන් විසින් කෝලම් හා ජන නාඩගම් ආශ්‍රිත කාන්තා චරිත රඟ දැක්වීම සිදු කර ඇත. ලාංකේය රජ දරුවන්, රදල ප්‍රධානීන් පිනවීම නින්දගම්වාසී කාන්තාවන්ගේ ප්‍රධාන රාජකාරිය වූ අතර යම් අයුරකට ජන පීඩක වැඩවසම් ක්‍රමයේ සංකේතයක් ලෙස දිග්ගෙයි නර්තන සම්ප්‍රදාය හඳුනාගත හැකිවිය. දිගින් සහ පළලින් විශාල වූ මහ ගේ ලෙස දිග්ගෙය හැඳින්වීමත් මහගෙයි නැටූ මැණිකේ මාණික්‍ය මහගේ ලෙස ව්‍යවහාරවීමත් පාදක කරගෙන පොදුවේ මෙම නර්තනයේ යෙදෙන කාන්තාවන් මාණික්‍ය මහගෙලා ලෙස අර්ථ ගන්වන ලදී. මෙහි මාණික්‍ය නිලය හිමි පංගුවට පරම්පරා හතරක් අයත්ව තිබිණි. එනම් එගොඩ මාණික්‍ය මහගේ, ගනේගොඩ මාණික්‍ය

මහගේ, හුණුවල මාණික්‍ය මහගේ සහ සපරගමුවේ මාණික්‍ය මහගේ පරපුර ලෙසයි. මෙම ප්‍රධාන පරම්පරාවල පිරිස්වලට ගෝලයන් හතරදෙනා බැගින් ගෝලයන් දොළසක් සිටි බවත් දිග්ගෙයි ගීතිකා නම් පද්‍ය විශේෂයකින් හා හස්ත මුද්‍රා නැටුමක් ලෙස නර්තනය රඟ දැක්වීම සිදු කළ බවත් අධ්‍යනයේ දී හඳුනාගත හැකිවිය. දවුල් ගැසීම මොට්ටුකාර පංගුවෙන්ද, තාලම් පදය තාලම්පට පංගුවෙන්ද, මහගෙල නර්තනය මාණික්‍ය පංගුවේ කාන්තාවන් විසින් ඉදිරිපත් කළ අතර අතකින් පහනක් රැගෙන දෙවියන්ට පිටුනොපා නටන මෙම නර්තනයේ දී වාදකයන් ඔවුන් දෙස නොබලමින් ගායනයට, නර්තනයට අනුකූලව වාදනය සිදු කෙරිණි. පෙරහැර ඇතුළු විවිධ කාර්යයන්ට සම්බන්ධ වූ රජුගේ, රජු හමුවට පැමිණි රදල ප්‍රධානියෙකුගේ පීඩාව සංසිඳවීම, සරාගී හැඟීම් උද්දීපනය කරමින් රජුගේ අභිමානය වර්ණනා කරමින් ප්‍රශස්ති ගැයීම කාන්තාවන් සිදු කරන ලද්දේ යටිකයට දුහුල් වස්ත්‍ර ද, උඩුකය නග්නව ද තබා ගනිමිනි. කාව්‍යාකරණයේ නියැළෙමින් රැඟුම් දක්වා රජු පින වූ නාටිකාංගනාවන්ට පසුකාලීනව නිලතල සහ ගම්බිම් ලබාදීම සිදු විණි. රජුගේ මරණින් පසු දේවාල භූමිය තුළ දිග්ගෙයි නැටීම ආරම්භ වූයේ භක්තිය මුල් කරගෙන දෙවියන් විෂයෙහි දේව ගීතිකා, ප්‍රශස්ති කාව්‍ය ගායනා කරමින් සිදු කරන නර්තනයක් විලාසයෙනි. එහිදී නග්න වූ උඩුකය සහ දුහුල් වූ සළුවකින් වැසුණු යටිකයට මන්ත හැට්ටය සහ ඔසරිය පැළඳීම සිදුවිය. දිග්ගෙයි නර්තනය සහ දේවදාසී නර්තනය අතර සමානකම් දේවාලවල ඇති නළගනන්ගේ කැටයම් තුළින් අනාවරණය කරගත හැකි ය. මුල් කාලීනව හින්දු ආභාසයකින් රඟ දැක් වූ දිග්ගෙයි නර්තන සම්ප්‍රදාය පසුකාලීනව බෞද්ධ මුහුණුවරකින් ක්‍රියාත්මක වූ බවත් විදේශ බලපෑම්, නර්තනයේ දී භාවිත කරන ලද ඇඳුම් පැළඳුම් හේතු කරගෙන දිග්ගෙයි නර්තන සම්ප්‍රදායේ අභාවය සිදු බවත්, සංස්කෘතිකමය වශයෙන් සිදු වූ විපර්යාසයන් ද ඉහත අධ්‍යයනය තුළ දී හඳුනාගත හැකි විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

රාජපක්ෂ, එස්., (2006), ***සබරගමුවේ නර්තන කලාව***, කොළඹ.

(2003), ***සබරගමුව වංශ කතාව 3 වෙළුම***, දෙහිවල: ශ්‍රී දේවී ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, නැදිමාල

ඥානවිමල හිමි, කිරිඇල්ලේ. (1942), ***සබරගමුවේ පැරණි ලියවිලි.***